**පළාත් මහාමාර්ග ව්‍යාපෘතිය (උතුරු පළාත) - 2014**

-----------------------------------------------------

පළාත් මහාමාර්ග ව්‍යාපෘතියේ (උතුරු පළාත) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2010 ජනවාරි 11 දින එළඹි අංක 4630 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09 (ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-----------------------------------------------------------------------------

පළාත් මහාමාර්ග ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව එවකට පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය, වර්තමානයේ පළාත් සභා හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර උතුරු පළාත් සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. වැඩි දියුණු කළ මාර්ග යටිතල පහසුකම් කල්පවත්නා කළමනාකරණය තුළින් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ සමාජ- ආර්ථික මධ්‍යස්ථානවලට ප්‍රවේශය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිලි අනුව,ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 2,399.25 කට සමාන එජඩො මිලියන 21ක් වූ අතර මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 මාර්තු 31 ආරම්භ කළ අතර 2015 මාර්තු 31 අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

----------------------------------------------------------

මෙම මූල්‍ය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**1.4. විගණකගේ වගකීම**

------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මා අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර

පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------

#### 2.2.1 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම

--------------------------------------------

ව්‍යාපෘතිය විසින් මිලදී ගත් දේපල, යන්ත්‍ර හා පිරියත සඳහා එම වත්කම් වල භෞතික පැවැත්ම නිර්ණය කිරීමට සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික සත්‍යාපනය සිදුකර නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

-------------------------------

### 3.1 අරමුදල් උපයෝජනය

----------------------

මූල්‍යනය හා සමාලෝචිත වර්ෂය තුළ දී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදි අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මුල්‍යායනය කිරීමට එකඟ වූ වටිනාකම | | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|
| | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො (මිලියන) | රු. (මිලියන) | එජඩො. (මිලියන) | රු. (මිලියන) | එජඩො (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ස. | 21.00 | 2,399.25 | 6.17 | 806.80 | 15.05 | 2,023.08 |
| | 21.00 | 2,399.25 | 6.17 | 806.80 | 15.05 | 2,023.08 |

## 3.2 භෞතික ප්‍රගතිය

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව උතුරු පළාතේ කිලෝමීටර 100 ක් පමණ පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂා කළද පළාත්මාර්ග 12 ක දුර කිලෝමීටර 56.17 ක් පුනරුත්ථාපනය සඳහා ව්‍යාපෘතිය කොන්ත්‍රාත් පැකේජ 04 ක් පිරිනමා තිබුණි. පුනරුත්ථාපනය කිරීමට අපේක්ෂිත පළාත් මාර්ග 12 න්,පැකේජ 02 ක් යටතේ මාර්ග 06 ක දිග කිලෝමීටර 23.07 ක් දින 150 සිට දින 174 දක්වා ප්‍රමාද කාලයක් සහිතව 2013 ඔක්තෝබර් 30 දිනට සම්පූර්ණ කර තිබුණි. දුර කිලෝමීටර් 26.42 ක අනෙකුත් මාර්ගවල පුනරුප්ථාපන වැඩ 2014 දෙසැම්බර් 31 දිනෙන් සම්පූර්ණකර නොතිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද මාර්ග පුනරුත්ථාපන වැඩ වල විෂය පථය නිරන්තරයෙන් වෙනස් කර තිබුණි. ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තු සකස් කරන අවස්ථාවේ දී භූමි පරික්ෂණ නිවැරදිව ක්‍රියාත්මක කර නොමැති බව පිළිබිඹු වේ. ඉදිරිපත් කළ තොරතුරු අනුව, යාපනය දිස්ත්‍රික්කයේ සිවන් කෝවිල මාර්ගයේ, වේලානෙයි - සුරුවිල් මාර්ගයේ හා මන්දතිව් මාර්ගයෙහි පුනරුත්ථාපන වැඩ වල ප්‍රමාණ බිල්පත් හි ඇතුළත් ප්‍රමාණයන් සියයට 36 සිට සියයට 250 දක්වා සැලකිය යුතු ප්‍රමාණයන්ගෙන් වෙනස් වී තිබුණි.

(ආ) පැකේජ 02ක් යටතේ පළාත් මාර්ග 06 ක පුනරුත්ථාපනයන් අවසන් කර 2013 ඔක්තෝබර් 30 දිනට අඩුපාඩු පිළිසකර කිරීමේ වගකීම් කාලයද අවසන් වී තිබූ නමුත් උතුරු පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එම මාර්ග භාරගෙන තිබුණේ දින 72 සිට දින 132 දක්වා කාල පරිච්ඡේදයක ප්‍රමාදයක් සමගය.

(ඇ) සාධාරණ හේතු නොමැතිව ව්‍යාපෘති අධ්‍යක්ෂක විසින් පැකේජ 02ක් යටතේ පළාත් මාර්ග 06 ක පුනරුත්ථාපන වැඩ සඳහා දින 170 කට වඩා කාල දීර්ඝ කිරීම් ලබා දී තිබූ බව නිරීක්ෂණය විය.මේ සම්බන්ධයෙන් ණය ලබා දෙන ආයතනයෙන් පූර්ණ එකගතාවයක් ලබා ගෙන නොතිබුණි.

**3.4 මතභේදයට තුඩු දෙන කරුණු**

-----------------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) පෙර වර්ෂයේ නිම කරන ලද කොන්ත්‍රාත්තු පැකේජය සඳහා කොන්ත්‍රාත්කරු රු. මිලියන 68 ක අමතර ගෙවීමක් ඉල්ලා ඇති අතර ඊට සම්බන්ධ බේරුම් කිරීමේ ක්‍රියාවලිය 2015 අප්‍රේල් 31 දින වන විටත් විසඳී නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව සන්දිලිපායි- කනතොරොඩෙයි මාර්ගය, කුප්පිලාන්- කුරුම්බසිටි මාර්ගය පුනරුත්ථාපනය සඳහා කොන්ත්‍රාත්තු 2013 දෙසැම්බර් වලදී පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරු විසින් මේ සම්බන්ධයෙන් උතුරු පළාත් සභාව සමඟ අවබෝධතා ගිවිසුමකට අත්සන් කර තිබුණේ 2014 ඔක්තෝබර් 10 දින දීය.

(ඇ) ව්‍යාපෘතිය විසින් ව්‍යාපෘති කාර්යාලය සඳහා මාසිකව ගෙවන ගොඩනැගිලි කුලී වටිනාකම රු. 50,000 ප්‍රදේශයේ පවතින කුලියට වඩා වැඩි බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් තක්සේරු දෙපාර්තමේන්තුවෙන් මේ සඳහා තක්සේරු ලබා ගැනීමට ව්‍යාපෘතිය කටයුතු කර නොතිබුණි.